238

# වටිකා ප්‍රකරණය හෙවත් බෙහෙත් ගුලි කල්ක පොත
# පිළිබඳ
# නව සංස්කරණයක්

අමරසිරි පොත්තම්පෙරුම

අංකය 238

අංකය

*කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨයේ*
*දර්ශන විශාරද උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදී.*

වර්ෂය 1998

ලියාපදිංචි අංක: H/Ph.D/SIN/98/10

## සාරාංශය

වටිකා ප්‍රකරණය හෙවත් බෙහෙත් ගුළි කල්ක පොත පිළිබඳ නව සංස්කරණ යක් නමැති මෙ ම නිබන්ධනය පරිච්ඡේද හතරකින් ද ,සමාලෝචනය ,පෙළ ,අර්ථ විවරණය,ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය පරිශිෂ්ටය, සූචිය යන අන්‍ය උපාංගයන් ගෙන් ද සමන්විත වේ.

මෙ කී නව සංස්කරණයට පාදක වූ ක්ෂේත්‍රගත අවශ්‍යතාව පෙරවදනින් පැහැදිලි කැර ඇත.

පළමු පරිච්ඡේදයෙන් දේශීය වෛද්‍ය සාහිත්‍ය පිළිබඳ සංක්ෂිප්ත විමර්ශනයක් දැක්වේ. එහි ලා අනුරාධපුර යුගයේ සිට කොළඹ යුගයේ වර්තමානය දක්වා ලියැවුණු දේශීය වෛද්‍ය ග්‍රන්ථ සැකෙවින් විස්තර කැරේ.

දෙ වන පරිච්ඡේදය වටිකා ප්‍රකරණය පිළිබඳ හැඳින්වීමක් සඳහා වෙන් වේ. එ ම හැඳින්වීම යටතේ ග්‍රන්ථ නාමය,අන්‍ය සංස්කරණ නාම,ග්‍රන්ථ කර්තෘ හා කාලය,ග්‍රන්ථ ප්‍රමාණය,අන්තර්ගතය සංස්කරණ තත්ව සංසන්දනය ,නව සංස්කරණයේ විශේෂතා ආදි කරුණු ඉදිරිපත් කර ඇත.

වටිකා ප්‍රකරණය පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනය තුන් වැනි පරිච්ඡේදයෙන් විස්තර වේ.එහි ලා විශේෂතා යටතේ ගුළි කල්ක නාමකරණය, අනුපාන භාවිතය,සන්නි විවරණය,කංසා හා ජයපාල ප්‍රයෝගය,තනකිරි සංකල්පය,දකුණු ඉන්ද්‍රිය ආභාසය, හා පර්යේෂණයනට භාජන වූ ගුළි කල්ක පිළිබඳ කරුණු දැක්වේ. මෙ කී ග්‍රන්ථයේ සාම්‍යතා ,ප්‍රබලතා, දුර්වලතා හා මතභේද ද සම්භාව්‍ය හා ජන සාහිත්‍යයට ඇති සම්බන්ධතාව ද විමැසුමට ලක් කර ඇත.

සිව් වන පරිච්ඡේදයෙන් වටිකා ප්‍රකරණයේ සමාජවිද්‍යාත්මක හා මානව වංශ වෛද්‍ය විද්‍යාත්මක අගය විග්‍රහ කර ඇත. සමාලෝචනය යටතේ මේ ග්‍රන්ථයේ ප්‍රයෝජනත් ඒ ලබා ගැනීම සඳහා නව යෝජනාත් දැක්විණි.

අනතුරු ව පෙළත් ,අර්ථ විවරණයත් පිළිවෙළින් දක්වා ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය ප්‍රාථමික හා ද්විතීය ප්‍රභේදානුසාරයෙන් ඉදිරිපත් කර ඇත. පරිශිෂ්ටයෙහි ලා ගැටපදය ද රසෞෂධ ශෝධන මාරණ විධි ද පූර්ව සංස්කරක ගුළි කල්ක දර්ශකයක් ද පාඨක පහසුව සඳහා ඇතුළත් කැරිණි.

ග්‍රන්ථාවසානයේ සූචිය ඉදිරිපත් කර තිබේ.